# 22. ජලය

අල්ලාහ් අපට වටිනා සම්පත් බොහෝමයක් ලබා දී ඇත. ජලය එයින් එක් සම්පතක් වේ.

ජලය නොමැති ව ජීවත් විය නොහැකි ය. ජලය නොමැති නම් ධාන්‍ය වර්ග, එළවළු, පලතුරු යනාදිය අපට නො ලැබේ. මෙතරම් අත්‍යවශ්‍ය ජල සම්පත අපට ලබා දෙන අල්ලාහ්ට අප ස්තුති වන්ත විය යුතු ය.

අල්ලාහ් අහසේ සිට පිරිසිදු ජලය වැස්ස ලෙස ලබා දෙයි. අපි ගංගා, පොකුණු සහ ළිංවලින් ජලය ලබා ගනිමු.

අප මේවා අපිරිසිදු කළොත් පිරිසිදු ජලය නො ලැබේ. අපිරිසිදු ජලය පානය කිරීමෙන් හා ප්‍රයෝජනයට ගැනීමෙන් ලෙඩ රෝග ඇති වේ.

අල්ලාහ් අල්-කුර්ආන්හි මෙසේ පවසා ඇත. "ඔබ පානය කරන ජලය ගැන සැලකිලිමත් වන්නෙහි ද? වලාකුළුවල සිට එය ඔබ වස්සවන්නෙහි ද? නැතිනම් අපි වස්සවන්නෙමු ද? අප කැමති නම් එය ලුණුදිය බවට පත් කරන්නට තිබුණි. (මෙයට) ඔබ ස්තුතිවන්ත විය යුතු නොවේ ද?"

ජලය අපතේ යැවීම ගැන අල්ලාහ් කැමති වන්නේ නැත. එම නිසා ජලය අපිරිසිදු කිරීම හෝ අපතේ යැවීම හෝ නොකළ යුතු ය. ජලය අවශ්‍ය ප්‍රමාණයටත්, අරපිරිමැස්මෙනුත් ප්‍රයෝජනයට ගැනීම අත්‍යවශ්‍ය වේ.

## පැවරුම්

**පහත සඳහන් වාක්‍ය හරි නම් "ඔව්" යනුවෙන් ද වැරැදි නම් "නැත" යනුවෙන් ද ලකුණු කරන්න.**

1. ජලය අල්ලාහ්ගෙන් ලැබුණු සම්පතකි. ඔව්/නැත
2. ජලය අපට ලබා දුන් අල්ලාහ්ට ස්තුති කළ යුතු ය. ඔව්/නැත
3. අපිරිසිදු ජලය පානය කිරීම සුදුසු ය. ඔව්/නැත
4. ජලය අපතේ යැවීමට අල්ලාහ් කැමති නැත. ඔව්/නැත
5. ජලය අරපිරිමැස්මෙන් ප්‍රයෝජනයට ගත යුතුයි. ඔව්/නැත